මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை. | The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

මගේ අංකය / எனது இல. / My No.: BD/CBP/01/01/46/2025
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025-10-30

**අයවැය චක්‍රලේඛ අංක: 04/2025**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන්

**අංක 2458/65 දරන 2025-10-18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත පරිදි අමාත්‍යාංශ අතර විෂයයන් බෙදා වෙන් කිරීමට අනුකූලව 2025 අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන ප්‍රතිපාදන යොදා ගන්නා ආකාරය**

## 01. අයවැය ප්‍රතිපාදන

### 01.1 සැපයුම් හා සේවා වියදම්

අංක 2458/65 දරන 2025-10-18 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් අමාත්‍යාංශ කිහිපයකට පවරා තිබුණු විෂයයන් හා කාර්යයන් සංශෝධනය කර තිබේ. 2025 වර්ෂයේ ඉතිරි මාස දෙකක කාලය තුළ 2025 අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන වැය විෂයය විස්තර යටතේ වැය දැරීමට අවශ්‍ය උපදෙස් මෙම චක්‍රලේඛය මගින් නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, 2025 වර්ෂය තුළ නව අමාත්‍යාංශවල ඉදිරි කටයුතු පවත්වාගෙන යාමේ දී මේ සමඟ අමුණා ඇති උපලේඛන 01හි 02 තීරුවේ දක්වා ඇති වැය විෂයය විස්තර යටතේ මේ වන විට ඉතිරිව පවතින ප්‍රතිපාදන උපයෝගී කරගත යුතු ය. අමාත්‍යාංශ අතර විෂයයන් හා කාර්යයන් බෙදීමට අනුරූප වන ලෙස ව්‍යාපෘති/උප ව්‍යාපෘති හඳුනා ගැනීමෙන් අනතුරුව අයවැය ප්‍රතිපාදන නව අමාත්‍යාංශ යටතට ඇතුළත් කරමින් එම උපලේඛනය සකස් කර ඇත.

2025 වර්ෂය තුළ ඉදිරි වියදම් සඳහා බැඳීම් ඇති කර ගැනීමේ දී මෙම චක්‍රලේඛය නිකුත් කරන දිනට ඒ ඒ වැය විෂයය විස්තරය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණයෙන් මේ දක්වා දරා ඇති වියදම් සහ බැඳීම් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අඩු කළ පසුව ඉතිරිවන ප්‍රතිපාදන ප්‍රමාණය පදනම් කරගත යුතු ය.

අලුතින් ඇති කරන ලද වරාය හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලයේ වියදම් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන 117-1-28 ව්‍යාපෘතිය යටතේ අදාළ වැය විෂයයන් භාවිත කරමින් සිදු කිරීමට නිර්දේශ කරන අතර යම් ප්‍රතිපාදන ඌනතාවයක් පවතී නම් ඒ සඳහා අමතර ප්‍රතිපාදන ඉල්ලුම් කළ යුතු ය.

දෙපාර්තමේන්තු සහ පළාත් සභා සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන වැය ශීර්ෂ අතර බෙදී නොයන බැවින්, එම වැය ශීර්ෂ ඒ ආකාරයටම තවදුරටත් භාවිත කළ හැකි වේ.

### 01.2. අත්තිකාරම් ගිණුම් කටයුතු

2025 වර්ෂයේ ඉදිරි කාලය සඳහා කාර්ය මණ්ඩලය සඳහා ණය අත්තිකාරම් ලබා දීමේ දී 2025-10-18 දිනට පූර්වයෙන් ඒ ඒ නිලධාරියා අනුයුක්තව සිටි වැය ශීර්ෂයට අදාළ අත්තිකාරම් ගිණුම් විෂය අංකය යටතේ වෙන් කර ඇති ප්‍රතිපාදන තවදුරටත් යොදා ගත යුතු ය.

**02. අක්මුදල් නිදහස් කිරීම**

2025 වාර්ෂික අයවැය මඟින් සම්මත වී ඇති වැය ශීර්ෂ මතම ඉදිරියටත් අක්මුදල් නිදහස් කිරීම සිදු කරනු ලබන බැවින් දැනට ක්‍රියාත්මක අග්‍රිම ගිණුම් අංක 2025-12-31 දින තෙක් එලෙසම පවත්වා ගෙනයා යුතු ය. අක්මුදල් ඉල්ලීම් ඉදිරිපත් කිරීමේ දී අංක 01 උපලේඛනය අනුව ප්‍රතිපාදන පවරා දී ඇති නව අමාත්‍යාංශවල ලේකම් මඟින් අවශ්‍ය අක්මුදල් ඉල්ලීම් ඉදිරිපත් කළ යුතු වන අතර භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් පූර්වයෙන් අක්මුදල් නිදහස් කරන ලද අග්‍රිම ගිණුම යටතේ වූ නිල බැංකු ගිණුම වෙතම අක්මුදල් නිදහස් කරනු ඇත. එම අක්මුදල් අදාළ පරිදි නව අමාත්‍යාංශයේ ලේකම් වෙත අතුරු අග්‍රිමයක් වශයෙන් නිදහස් කරනු ඇත.

**03. ගිණුම් තැබීම**

අමාත්‍යාංශවල විෂයයන් හා කාර්යයන් සංශෝධනය වුව ද, 2025 අංක 03 දරන විසර්ජන පනත තවදුරටත් බලාත්මක බැවින් විසර්ජන පනතේ සඳහන් වැය ශීර්ෂ හා ඊට අදාළ අනුමත අග්‍රිම ගිණුම් තවදුරටත් එලෙසම බලාත්මක වේ. ඒ අනුව, 2025 වර්ෂයේ ඉදිරි කාලය තුළ වියදම් දැරීමට අදාළව ගිණුම් තැබීම, 2025 අංක 03 දරන විසර්ජන පනතේ වැය ශීර්ෂ හා 2025 අයවැය ඇස්තමේන්තුවල දැක්වෙන වැය විෂයය විස්තර යටතේ ම සිදු කළ යුතු ය.

**04. වාර්ෂික ගිණුම් ප්‍රකාශන**

2025 වර්ෂය සඳහා ගිණුම් ප්‍රකාශන පිළියෙළ කිරීම විසර්ජන පනතේ සඳහන් වැය ශීර්ෂ යටතේ භාණ්ඩාගාරය විසින් ලබා දෙන උපදෙස්වලට අනුකූලව සිදු කළ යුතු ය.

**05. කාර්ය මණ්ඩලය**

අමාත්‍යාංශ අතර කාර්යයන් බෙදී යන ආකාරයට අනුකූල වන පරිදි කාර්ය මණ්ඩලය අමාත්‍යාංශ වෙත අනුයුක්ත කිරීමට කටයුතු කළ යුතු ය.

**06. 2026 වර්ෂයට අදාළ සංශෝධන**

2026 වර්ෂයේ අයවැය සඳහා අවශ්‍යවන සංශෝධන එම වසරට අදාළ විසර්ජන පනත සම්මත වීමට පෙර සිදු කිරීමට කටයුතු කරනු ඇත.

මෙම චක්‍රලේඛය සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිලි කිරීම් ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල් එම්. අනෝමා නන්දනී මහත්මිය (දු.අංක. 0112-484681) විමසා ලබා ගත හැකි ය.

**ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම**
භාණ්ඩාගාර ලේකම්

පිටපත් : (i). ජනාධිපති ලේකම්
(ii). අග්‍රාමාත්‍ය ලේකම්
(iii). අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
(iv). විගණකාධිපති